# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2020.11.25 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2020 ඔක්තෝබර්

**2020 ඔක්තෝබර් මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පහළ යන ලදී.**

**ඔක්තෝබර් මස මුල සිට ආරම්භ වූ COVID-19 වසංගතයේ දෙවන රැල්ලේ අහිතකර බලපෑම් හේතුවෙන් 2020 ඔක්තෝබර් මාසයේදී නිෂ්පාදන කටයුතු වල ක්‍රියාකාරීත්වයේ පහළ යාමක් පෙන්නුම් කරන ලදී.** ඒ අනුව, විශේෂයෙන්ම ඇඟලුම් නිෂ්පාදන සහ ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශවල නිෂ්පාදනය, නව ඇණවුම්, සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් වල සිදුවූ සැලකිය යුතු පහළ යාම හේතුවෙන් නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ඔක්තෝබර් මාසයේදී 40.3ක් දක්වා පහළ යන ලදී.

| | |
|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**<br>**40.3** | **2020 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 19.5ක පහළ යෑමකි** |

ඔක්තෝබර් මාසයේදී සේවා නියුක්තිය පහත වැටීම ද සමඟ සියලු නිෂ්පාදන අංශවල නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහත යන ලදී. වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා මෙම මාසය තුළ පැනවූ ඇඳිරි නීතිය හේතුවෙන් සිය කර්මාන්තශාලා මෙහෙයුම් සඳහා විශාල වශයෙන් බාධා ඇති වූ බව ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශවල බොහෝමයක් ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කරන ලදී. තවද, වසංගතයට ඇති බිය නිසා සමහර සේවකයින් සේවයට වාර්තා කිරීමට මැලිකමක් දැක්වූ අතර, බොහෝ සේවා යෝජකයින් සෞඛ්‍ය බලධාරීන්ගේ මාර්ගෝපදේශ අනුගමනය කරමින් ඔවුන්ගේ පූර්ණ ශ්‍රම බලකාය සේවයේ යෙදවීමෙන් වැළකී සිටි බැවින් සේවයේ යෙදවුන සේවක සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුනු බවත් එම ප්‍රතිචාර දැක්වූවන් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

තවද, නිෂ්පාදනය සහ නව ඇණවුම් පහත වැටීම මෙන්ම අවිනිශ්චිතතාව ඉහළ යාමත් සමඟ තොග මිලදී ගැනුම් උප දර්ශකයද වැඩි වේගයකින් පහළ යන ලදී. ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය වැඩි වේගයකින් ඉහළ ගිය අතර, මෙහිදී වරාය/රේගු නිෂ්කාශනයේ සැලකිය යුතු ප්‍රමාදයක් අත්විදීමට සිදුවූ බව බොහෝමයක් ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **59.8** | **40.3** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 61.7 | 43.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිෂ්පාදන | 63.3 | 30.3 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 25.8 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 56.9 | 37.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 63.3 | 72.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ත අපේක්ෂාවන්ගේ උප දර්ශකය සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ සඳහා විශේෂයෙන්ම බස්නාහිර පළාත තුළ වැඩි වශයෙන් COVID-19 වසංගතයේ දෙවන රැල්ල ව්‍යාප්ත වීම හේතු විය.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6 කින් ඉහළ යමින් 2020 ඔක්තෝබර් මාසයේදී 53.0ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 ඔක්තෝබර් මාසයේදී ඉන්දියාව, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ චීනයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක තවදුරටත් වැඩි වේගයකින් ඉහළ ගිය අතර, යුරෝපා කලාපයෙහි එම දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 නොවැම්බර් 16 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුළුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**COVID-19 වසංගතයෙහි පළමු රැල්ල තුළින් ආර්ථිකයෙහි සේවා අංශයට සිදු වූ බලපෑම පසුගිය සිව් මස තුළ ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වෙමින් තිබුණ ද, COVID-19 වසංගතයෙහි දෙවන රැල්ලේ අහිතකර බලපෑම පිළිබිඹු කරමින්, 2020 ඔක්තෝබර් මාසයේ දී සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශකාංක 41.8 දක්වා පහළ ගියේය.** මෙම පහළ යෑම සඳහා නිමකිරීමට නියමිත කාර්යයන් හැර සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උපදර්ශකවල දක්නට ලැබුණු පහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා සහ රක්ෂණ උපඅංශයන්හි නව ව්‍යාපාර පසුගිය මාසයට සාපේක්ෂව 2020 ඔක්තෝබර් මාසයේ දී පහළ ගියේය.

COVID-19 වසංගතයෙහි දෙවන රැල්ල පාලනය කිරීමට ප්‍රාදේශීය මට්ටමෙන් පනවන ලද ඇඳිරි නීති තත්ත්ව සමග, ප්‍රධාන වශයෙන්, තොග සහ සිල්ලර වෙළඳාම, ප්‍රවාහන, නවාතැන් සහ ආහාරපාන සැපයීම යන උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් ද 2020 ඔක්තෝබර් මාසයේ දී පහළ ගියේය. තවද, රක්ෂණ සහ අධ්‍යාපනික සේවා උපඅංශවලට සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ද පහළ යෑමක් 2020 ඔක්තෝබර් මාසය තුළ දී දක්නට ලැබුණි. මීට අමතරව, ව්‍යාපාර ක්‍රියාකාරකම්හි පහළ යෑමට COVID-19 වසංගතයෙහි දෙවන රැල්ල තුළින් ඉල්ලුමට ඇති වූ අහිතකර බලපෑම් හේතු වූ බව ප්‍රතිචාර දක්වන්නන්ගෙන් 59.3%ක් සඳහන් කරන ලදී.

හුදකලා කර ඇති ප්‍රදේශවල පදිංචි වී සිටින සේවකයන් සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම්වලට සිදු වූ අවහිරතා සමග 2020 ඔක්තෝබර් මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් ඉහළ ගිය බව ඇතැම් ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී. මීට අමතරව, වසංගතය ආශ්‍රිත ගැටලු හේතුවෙන් සේවකයන් සේවයට වාර්තා කිරීමට මැළිවීම සහ සම්පූර්ණ කාර්ය මණ්ඩලය සේවයෙහි යෙදවීමට සේව්‍යයන් යොමු නොවීම ද ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සුමට ක්‍රියාකාරීත්වයට බලපෑම් එල්ල කරන ලදී.

| විචල්‍යය | සැප්. | ඔක්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **54.3** | **41.8** | **-** | **ඉහළ යෑමක සිට පහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 58.9 | 40.1 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 60.4 | 35.7 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 43.2 | 58.7 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 49.5 | 39.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 59.6 | 35.2 | - | ඉහළ යෑමක සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන්ගේ සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම සහ නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන්, 2020 ඔක්තෝබර් මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය.

මේ අතර, ශ්‍රී ලංකාව මුහුණ දී සිටින COVID-19 වසංගතයෙහි දෙවන රැල්ලත් සමග පවතින සුභවාදී නොවන අදහස් හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා ද 2020 ඔක්තෝබර් මාසයේ දී පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**41.8**

**2020 සැප්තැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 12.5ක පහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

අඛණ්ඩව සිව්වන මාසයටත් ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 සැප්තැම්බර් මාසයේ පැවති 52.0හි සිට 2020 ඔක්තෝබර් මාසයේ දී 52.9 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 ඔක්තෝබර් මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයෙහි එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 නොවැම්බර් 16 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.